Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 04/07/2018 |

පැමිණිලිකාරිය : සි. ආර්. සේරසිංහ මිය.
375/24. ආර්නෝල්ඩ් රත්නායක මාවත.
කොළඹ 10.

වගඋත්තරකරුවන් : විදුහල්පති.
ආනන්ද විද්‍යාලය.
කොළඹ 10.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/265/18</u>**

පැමිණිල්ල -:

ඉහත පැමිණිලිකාරිය විසින් 2018-01-24 වන දින සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සදහන් කර ඇත්තේ තම දරුවා 2018 වර්ෂයේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු වන වසරට ඇතුලත් කිරිමේ අරමුණින් සහෝදර පදනම යටතේ අයදුම පත්‍රයක් යොමු කල බවත්. සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි වී ලකුණු 64.5ක් උපයාගත් අතර. පාසලට ඇතුලත් කිරිමේ අවම ලකුණු සීමාව 19.9 ක් බවත්ය. නමුත් පදිංචි සනාථ කිරිමෙ ලේඛනයන්හි ගැටළුවක් පවතින බවට ආනන්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් තමාට දන්වන ලද බවත් සදහන් කර ඇත.

2017-07-31 දිනැති පාසල්වලට ළමුන් ඇතුලත් කරගැනිමේ චක්‍රලේඛ අංක 22/2017 හි 7 අනු අංක 1.3 යටතේ. යම් ගණයකට ලකුණු ලබා දිමේදි එම ගණයට හිමි ලකුණු ලබාදිමට නොහැකි වීම මත සම්පූර්ණ ලකුණු ලබාදිම ප්‍රතික්‍ෂේප නොකල යුතු බවට විදුහල්පතිවරුන් දැනුවත් කර තිබියදිත් වගඋත්තරකාර පාර්ශවය තමාගේ දරුවාට විශාල අසාධාරණයක් සිදු කර ඇති බව පැමිණිලිකාරිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කියාසිට ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 14. ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson : 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrc@sltnet.lk
දුරකථන
ලේකම්
ක්ෂණික
වෙබ්

ඒ අනුව පාසලට ඇතුලත් කර ඇති වැරදි සහගත තෝරා ගැනීම් සහ අවශ්‍ය ලකුණු උපයාගෙන ඇති තමාගේ දරුවා පාසලට තෝරා නොගැනීම හේතුවෙන් තම මූලික අයිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පැමිණිලිකාරිය විසින් සඳහන් කොට ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් වන පරීක්ෂණ කටයුතු සඳහා 2018 මාර්තු මස 09 දින ප.ව.2.30ට. හා 2018 අප්‍රේල් 20 වන දින ප.ව.2.30ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලෙසට වගඋත්තරකරු වෙත දන්වා ඇතත්. වගඋත්තරකරු විසින් 2018-03-09 වන දින ප.ව.2.30ට අසනීප වී ඇති බවට ෆැක්ස් මගින් දැනුම් දී ඇති අතර. ඒ අනුව 2018-04-20 දින නැවත කැඳවීම සිදුකර ඇතත් එදින කිසිදු හේතු දැක්වීමකින්ද තොරව පැමිණ නොමැත. මේ අනුව වගඋත්තරකරු දිගින් දිගටම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හැර ඇති බව නිගමනය වේ.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු ළමුන් පාසලට ඇතුලත් කරගැනීමේ චක්‍රලේඛනයේ 7.4 වගන්ති අනුව දැනටමත් අදාල පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර පදනම යටතේ ඉල්ලුම් කර සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 64.5 ක් උපයාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙහිදී එම ගණය යටතේ ලබා දී ඇති එක් නිර්ණායකයක් වන පදිංචිය තහවුරු කරන ලේඛන (පදිංචි ස්ථානයේ හිමිකම) පිළිගත නොහැකි වීම නිසා අදාල සිසුවා පාසලට ඇතුළත්කරගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

නමුත්. *"පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීමට අදාල අංක 22/2017 (1) දරණ සංශෝධිත චක්‍රලේඛනය අනුව මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබාදෙන හෙයින් ලකුණු ලබා දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද. ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර. එවැනි අවස්ථාවල එම ගණය සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය"* යනුවෙන් දක්වා ඇත.

පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා කොළඹ ආනන්ද විද්‍යාලයේ 08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර. දෙවන දරුවා 03 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවට කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් වී ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා සහෝදර පදනම මත සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 64.5ක් උපයාගෙන ඇති බවත් සහෝදර පදනම පාසලට ළමුන් ඇතුලත් කර

ගැනීමේ අවම ලකුණු සීමාව 19.9ක් වන බවත් ඉදිරිපත්ව ඇති කරුණු අනුව අනාවරණය වී ඇත. මේ අනුව පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයේදී කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 19.9 ක සීමාව ඉක්මවමින් ලකුණු 64.5 ක් උපයාගෙන තිබියදීත් පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කොට ගෙන නොමැති බව නිරික්ෂණය වේ.

තවද පැමිණිලි පාර්ශවය විසින් දක්වා ඇති පරිදි සහෝදර පදනම මත පැමිණිලිකාරියට වඩා අඩු ලකුණු ලබාගත් දරුවන් මේ වන විටත් පාසලට ඇතුලත් කර ගෙන ඇති බවටද කරුණු අනාවරණය වී ඇත.

මෙම කරුණු අනුව 2018 කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීමේදී පවතින චක්‍රලේඛයෙන් පරිබාහිරව අත්තනෝමතිකව ආකාරයෙන් කටයුතු සිදුව ඇති බවට නිරීක්ෂණය වන අතර. එම වැරදි සහගත ක්‍රියාවලිය හේතුවෙන් සුදුසුකම් ලබා ඇති පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත්ව අධ්‍යාපනය ලැබීමේ හිමිකම අහිමි වී ඇති බවද අනාවරණය වී ඇත.

සහෝදර පදනම යටතේ දරුවන් ඇතුලත් කොට ගතයුත්තේ කුමන ආකාරයෙන්ද යන්න චක්‍රලේඛනය තුළ ඉතා නිවැරිදිව දක්වා ඇති අතර. චක්‍ර ලේඛයේ නිර්නායකයන් යටතේ ඉතා නිවැරදිව සහෝදර පදනම යටතේ සුදුසුකම් ලබන්නේ කවුරුන්ද යන්න හදුනාගැනීමට නිත්‍යානුකුල හැකියාව තිබියදී හා පැමිණිලිකාරියගේ වැඩිමහල් දරුවන් 08 ශ්‍රේණිය හා 03 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටීම මත ඊට අදාල සියළු ලේඛන ඉදිරිපත් කර තිබියදී සාධාරණ ඉටු නොකර නිත්‍යානුකුල නොවන තෝරා ගැනීම් සිදු කර ඇති බවට කොමිෂන් සභාවේ හමුවේ නිරීක්ෂණය වී ඇත.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවති විමර්ශනයට වගඋත්තරකාර විදුහල්පතිවරයා කරුණු දැක්වීමට නොපැමිණීම මත කොමිෂන් අගෞරවයට ලක්වන අයුරින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත්ව ඇති සමස්ථ කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරු විසින් ක්‍රියා කොට ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. පැමිණිලිකාරියගේ දරුවා ආර්.ජ්.බී.සී. සේරසිංහ දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට මෙගින් නිර්දේශ කරනු ලැබේ.

2. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයන් සඳහා හේතු දැක්වීමකින් තොරව පැමිණීම පැහැර හැර තිබීම මත 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 20(3) 21(3) වගන්ති ප්‍රකාරව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය හැකි අපහාස වරදක් සංයුක්ත වීම මත මෙ පිළිබඳ 1996 අංක 21 දරණ මානව හිමිකම් පනතේ 21(4) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කිරීමට පෙර පළවන වගඋත්තරකාර පාර්ශවය විසින් ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු දැක්වීම පවත දිනට පෙර කළ යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2018.08.15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :-

1. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ගරු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

B/